ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P. O. BOX 64678**
**LONDON NW3 9LS**
**ENGLAND**

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## හෙට යහපත් වේද?

අද ලෝකය පුරාම රටවල ජනතාව අතර කිසියම් සැකයක් මතුව තිබේ. එය නොයෙක් ආකාරයෙන් ප්‍රශ්න වශයෙන් ඔවුන් අසනු කතා බහට ලක්කරනු අපට කියවන්නට අසන්නට ලැබෙයි. ඒ සැකය අනාගතය හෙවත් හෙට දවස පිළිබඳවය. එනම්, හෙට කෙබඳු වේද? යන්න ය. ඒ සැකය ගෙනෙන්නේ සුව පහසු හැඟීමක් නොවේ. අනියත බියකි. ඒ බිය තුනී වන බවක් දක්නට නොලැබෙයි. එය එසේම පවතී. දින දින වර්ධනය වෙයි.

හැත්තෑව දශකයේ මහගම සේකර කවියා ඔහුගේ කාව්‍ය සංග්‍රහයක මෙසේ ලීවේ ය.

"අද මා මේ ලියන කවි අනාගතයේ ලෝක ය යහපත් වූ දිනක ඔබ මෙයට වඩා ආදරයෙන් යුතුව කියවන බව දනිමි."

සේකර එසේ කීවේ ඔහු ජීවත්වූ කාලය අයහපත් වූ නිසා නොවේ. ඒ කාලය අපි ද හොඳින් දනිමු. එය යහපත් එසේම සෞන්දර්යයෙන් පිරුණු කාලයක් විය. එහෙත් සේකර සිතන්නට ඇත්තේ තාක්ෂණික දියුණුවත් සමග මතු ලෝකය වඩාත් පියකරු, මනුෂ්‍ය හිතකර, මිත්‍රශීලී, ගැටුම් විරහිත ලෝකයක් වේවි ය යන්නය. ඔහු එසේ සිතීමේ වරදක් නැත.

අද මහගම සේකරයෝ ජීවතුන් අතර නොවෙති. ඔහු එදා ප්‍රාර්ථනා කළ දෙය සිදු-නොවන බව අද වනතුරා අපට දක්නට ලැබී ඇති දෙයින් මනාව වැටහේ. එසේ නම් හෙට ගැන කියනුම කවරේ ද?

ශුභවාදිව සිතන්න, ධනාත්මකව සිතන්න (Think positive, pessimistic) ආදී වශයෙන් අද බොහෝ දෙන කතාකරනු ඇසේ. විශේෂයෙන් වෙළඳ නියෝජිතයෝ සහ මාර්කටිං කොම්පැණි එසේ කතා කරති. ඒ අනුව සාමාජිකයන් පුහුණු කරන ආයතනද ඇත. ඒ සේරම කතා හෘදයාංගමව නොව බඩු භාණ්ඩ විකුණා ගැන්මට ය. ඒවායේ වාසිය බහුජාතික සමාගම්වලටය. එසේ නැතුව ලෝකය යහපත් තැනක් වනු දකින ආසාවෙන් නොවේ.

ලෝකය සැබැවින්ම ඉදිරියට යහපත් වේ දැයි හරිහැටි මැන බලන්නට බොහෝ දේ අද අප ඉදිරියේ ඇත. ඒ තුළින් බලන කල්හි අප දකින්නේ කුමක්ද? යහපතක්ද? නැත.

අද ලොව ප්‍රධානතම නිශ්පාදනය සහ වෙළඳාම අවි ආයුධ ය. එය එන්න එන්නම වැඩි වෙනවා මිස නවතින පාටක් නැත. ඒ කුමකටද? මිනිස් ඝාතනයට ය. මේ ලියන මොහොතේ ද ලොව රටවල් කීපයක බෝම්බ පිපිරෙනවා ඇත. මිනිසුන් සිය ගණනක් මිය යනවා ඇත. ධනවත් රටවල් එදා මෙන් අදද දිළිඳු රටවල් සූරාකති. තමන් කැමති ඕනෑම රටක් ආක්‍රමණයකර එහි රජය පෙරළා දමති.

විෂ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අළෙවිය එන්න එන්නම වැඩිවේ. තරුණ පෙළ ඒවාටද මත්පැනටද දැඩි ලෙස ගොදුරුව සිටිති. ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, මිනීමැරුම්, කොල්ලකෑම් බොරුව, වංචාව ඉහවහා ගොස් ඇත. නීතිය සාමය යයි දෙයක් බොහෝ රටවල් හඳුනන්නේ වත් නැත. ආගම දහම යයි කිසිවක් තිබුණා ද පිළිපදින බවක් නම් නොපෙනේ.

අද කාරණා මෙසේ ය. හෙට දවස ගැන මගේ නම් තඹ සතයක විශ්වාසයක් නැත.



## බුදුවීම

බුදුවීම යන වාග්ප්‍රයෝගයෙන් ප්‍රබෝධ වීම, පිපීම, පිබිදීම, අවදිවීම යනාදී අර්ථයන් ජනිතවේ. ඒ කුමන අර්ථයකිනුත් මූලික වශයෙන් කියවෙන්නේ සැඟවී තිබුණ සුන්දරත්වයක් මතුවී විකශි(සි)ත වීමයි. ගහක හෝ වැලක සැඟවී ඇති ස්වභාවික සුන්දරත්වය මතුපිටට පැමිණ විකසිතවීම මල් පිපීමක් ලෙස හැඳින්වේ. මලක් පිපෙනවිට සිදුවෙන්නේ ගහක හෝ වැලක ස්වභාවික ලෙස සැඟවී ඇති රමණීය වර්ණයන්ගේත්, ඉමිහිරි මල්පැණිවලත්, මටසිලිටි, මුදු මොළොක් මල්පෙතිවලත් සුන්දරත්වය කැටිවී ලෝක සත්වයාගේ ඉන්ද්‍රියන්ට ගෝචරවන සේ ප්‍රකට වීමයි. අප හැම කෙනෙකු තුළම ආධ්‍යාත්මික ලෙස සැඟවී ඇති එවන් පරම සුන්දරත්වය බෝධි නමින් හැඳින්වේ. බුදුවීම යනු ඒ බොධිභාවය මතුවී පිපීම නොහොත් විකශිත වීමයි.

අප තුළ සැඟවී ඇති බෝධිභාවය එලෙස අවදිවීම ලොවුතුරා බුද්ධත්වයට හෝ පසේබුදු බවට හෝ ශ්‍රාවක බුද්ධත්වයට පත්වීම මගින් සිදුවිය හැක. ඒ ත්‍රිවිධාකාර බුදුවීම් එකිනෙකට වෙනස් වන්නේ බුද්ධත්වයට නොහොත් බුදුබවට පත්වන්නන්ගේ භෞතික නොහොත් ශාරීරික හැකියාවන්ගේ වෙනස් කම් අනුව මිස, ත්‍රිවිධ බුද්ධත්වයන් අතර අධ්‍යාත්මික වශයෙන් දැකිය හැකි උස් මිටිකම් ආදිය අනුව නොවේ. කුමන බුද්ධත්වයකට හෝ පදනම්වන්නේ එකම නිර්වාණ ධර්මයයි.

ඒ නිර්වාණ ධර්මය කොයි කාටත් එකවගේම සර්ව සාධාරණවන නිසා, ලොවුතුරා බුදුවරයකුට පළවෙනි පන්තියේත්, පසේබුදුවරයකුට මධ්‍යම පන්තියේත්, සාවක බුදුවරයකුට තුන්වෙනි පන්තියේත් නිර්වාණ ධර්මයක් සාක්ෂාත් වෙන්නට විධියක් නැත. ඒ නිර්වාණයත්, බුද්ධත්වයත් එකම කාසියක් දෙපැත්ත සේ එකිනෙකින් වෙන් කළ නොහැකි පරමෝත්තම ද්විත්ව ධර්මතාවයක් නිසා, බුද්ධත්වය යම් තැනකද, එතැන නිර්වාණයත්, නිර්වාණය යම් තැනකද, එතැන බුද්ධත්වයත් අනිවාර්යයෙන්ම ඇත. සංයුත්ත නිකායේ එන වක්කලි සූත්‍රයේදී යෝ වක්කලි ධම්මං පස්සති, සෝ මං පස්සති, යෝ මං පස්සති, සො ධම්මං පස්සති යයි නිවන් දහම දැකීමෙන් බුද්ධත්වයත්, බුද්ධත්වය දැකීමෙන් නිවන් දහමත් දැකිය හැකි බව බුදු හිමියන් වක්කලී හිමියනට වදාළේ බුද්ධත්වයත්, නිර්වාණ ධර්මයත් එකිනෙකින් වෙන්කළ නොහැකි සේ ඒකාත්මිකව ඇති අද්වෛත ධර්මයක් බැවිනි. මෙහි දැකීම යනු ඒ ධර්මයන් සාක්ෂාත්වීමයි.

අප හැම කෙනෙකු තුළම කිසි දිනක ඇති නොවන හෝ කිසි දිනක නැතිනොවන සනාතන බුද්ධත්වයක් මෙන්ම සනාතන නිර්වාණ ධර්මයක්ද සැඟවී තිබේ. බුදුවීම යනු ඒ නිවන හා බුද්ධත්වය එකම විටක එකටම මතුවීමයි. එලෙස බුද්ධත්වයත් සමග නිර්වාණ ධර්මයද එකවිට එකටම මතුවන්නේ ඒ නෛසර්ගික ධර්ම ස්වරූපය වසාගෙන එක පිට එකට ගොඩගැසී ඇති ක්ලේශ ධර්මයන් සම්පූර්ණයෙන් ඉවත්වූ විටය.

ධම්මපදයේ මල වග්ගයෙහි
අනුපුබ්බේන මේධාවී
ථෝකථෝකං ඛණේඛණේ යයි සඳහන්වන පරිදි ආරම්භයක් නොපෙනෙන සංසාරයේදී අප තුළ අනාදිමත් කාලයක් තිස්සේ ගොඩගැසී ඇති කෙලෙස් මලකඩ ගලවාගත හැකි වන්නේ ටිකෙන් ටික මොහොතින් මොහොතය. කෙලෙස් මලකඩ ගොඩ ගැසෙන්නට පටන්ගත් කල එක පිට එක තව තවත් ගොඩ ගැසෙන්නාසේ, ඒවා ගැලවෙන්නට පටන්ගත් විටද එකිනෙක ටිකෙන් ටික ගැලවීගෙන යයි. නිවන් දැක බුදුවිය හැකි වන්නේ එලෙස ගැලවෙන කෙලෙස් මලකඩ මුලුමනින්ම ගැලවී ගොස් අන්තයටම හිත පිරිසිදුවූ පසුවය.

♦ සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම Harrow UK

## බුදුවරයෙකු හඳුනාගැන්ම

ද්‍රෝණ නමැති එක් බ්‍රාහ්මණ තරුණයෙක් දිනක් බුදුහාමුදුරුවන්ගේ අසාමාන්‍ය වූ ප්‍රසන්න පෙනුමෙන් පැහැදී " ඔබ කවුරුද? මනුෂ්‍යයෙක්ද දෙවිකෙනෙක්ද? " යනුවෙන් ඇසූ කල උන්වහන්සේ එම තරුණයාට දුන් පිළිතුරය මේ.

**පුණ්ඩරීකං යථා වග්ගු**
**තෝයෙන නුපලිප්පති**
**නුපලිත්තෝම් හි ලොකෙන**
**තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණාති**

**සිත් අලවන පිපුණු නෙළුම් මලක් ජලයෙහි නොගෑවී සිටින්නේ යම්සේද මමත් මේ ලෝකයේ නොඇලී වෙසෙන්නෙමි. එහෙයින් බ්‍රාහ්මණය ලෝකයා විසින් මා බුදුන් ලෙස අමතනු ලබන්නේ ය.**

**As a Lotus fair and lovely,**
**By the water is not soiled,**
**By the world I am not soiled**
**Therefore, Brahmin, I am Buddha**

Above is the reply given to the Brahamin youth Drona by the Lord Buddha, when the former asked the Buddha " Who are you exactly ? "

A blue lotus, a red lotus or a white lotus is born in the water. It grows in the water but it remains uncontaminated and untouched by water. Thus a man was born and grown up in this world but he rose above all ordinary men and women and defeated all worldly weaknesses. The world called him - the **BUDDHA**.

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**දකිඝද්ව යජ්ජීව්‍යතෙ ක්ෂණම්පි ප්‍රථිතං මනුෂ්‍යෙ**
**විඥාන වික්‍රම යශොභිර් අභජ්‍යමානම්**
**තන්නාම ජීවිතමිහ ප්‍රවදන්ති තජඥා**
**කාකොපි ජීවති චිරාය බලිඝද්ව භුංකෙත**

***අර්ථය*** : *දැනුම බලය හා කීර්තිය යන මේවායින් නොබෙදුණු ප්‍රසිද්ධ වූ මිනිසුන් විසින් ඇසිල්ලකුදු යම් ජීවිතයක් පවත්වනු ලැබේද ඒ ජීවත්වීම මේ ලෝකයේ උතුම්ම ජීවිතය යයි තතු දන්නෝ කියති. කපුටා ද බොහෝ කලක් ආහාර අනුභව කරමින් ජීවත්වෙයි.*

උතුම් මිනිසාගේ ජීවත්වීම හෙවත් උතුම් ජීවිතය පිළිබඳව මෙම පද්‍යයෙන් විස්තර කෙරේ. උස් පහත් වශයෙන් හෝ හොඳ නොහොඳ වශයෙන් හෝ කෙටි හා දිගු කාලීන වශයෙන් හෝ අපි සැවොම මෙලොව ජීවත්වෙමු. නමුත් අප හැමදෙනාගේම ජීවත්වීම එක හා සමාන නොවේ. එහි විවිධත්වයක් ඇත. විෂමතාවක් ඇත. ඒ එකිනෙකාගේ එකිනෙකට වෙනස් වූ ක්‍රියාකාරීත්වය අනුවයි.

මේ පද්‍යයේ සඳහන් ආකාරයට දැනුම, බලය හා කීර්තියෙන් පිරිපුන් පුද්ගලයාගේ ජීවත්වීම උතුම් එකක් ලෙස හුවා දක්වා ඇත. ඒ පුද්ගලයා ද ඔහු තමා වෙසෙන සමාජය තුළ කටයුතු කරන හා ජීවත්වන ආකාරය ද ආදර්ශමත් වූවකි. බුද්ධිමත් පුද්ගලයා තම බුද්ධිය මෙහෙයවා බොහෝ දෙනාට සෙත සලසයි. බලවතා තම බලය උපයෝගී කරගනිමින් බොහෝ දෙනාගේ හිත සුව පිණිස ක්‍රියාකරයි. කීර්තිමත් පුද්ගලයා ද එසේමයි. නමුත් අවාසනාවකට අද සමාජයේ එබඳු උතුම් පුද්ගලයින් දුලබයි. අද අපට හමුවන බුද්ධිමත් යයි කියන බලවත් හා කීර්තිමත් පුද්ගලයින් දෙස බැලීමෙන් මෙම කාරණය අපට තහවුරු කරගත හැකිය. සමාජයට විනා කරන එබඳු පුද්ගලයින්ගෙන් අද අප සමාජය පිරී පවතී. විශේෂයෙන් ධන බලය හා දේශපාලන බලය නිසා කීර්තියට පත් පුද්ගලයින් මේ සඳහා හොඳම නිදසුන්ය.

නමුත් දැනුම, බලය හා කීර්තිය යන මේ අංග තුනෙන් පිරිපුන් යහපත් සත්පුරුෂයා ඒ කාරණා හේතු කොටගෙන විශාල සමාජ මොහවරක් සිදුකරයි. මෙම පද්‍යයෙන් විස්තර කරන ආකාරයට එබඳු පුද්ගලයින් එක මොහොතක් හෝ ජීවත්වේ නම් ඒ කෙටි කාලය වුව ද කැපකරන්නේ අනුන්ගේ යහපත සඳහාම ය. ඔහු බොහෝ කලක් ජීවත්වන්නේ නම් එය සමාජයට කොතරම් භාග්‍යයක්ද?

මෙහිදී එබඳු ගුණවලින් හීනවූ පුද්ගලයින් හරියට කපුටන්ට උපමා කොට ඇත. කවුරුත් දන්නා පරිදි කපුටා යනු කෑදරකමේ සංකේතයකි. කපුටාට හැම මොහොතකම කෑම අවශ්‍යය. ඔහුගේ ජීවත්වීම කෑම සඳහාම යයි කීවද නිවැරදි ය. උදර පෝෂණය ගැන පමණක්ම වෙහෙසෙන කපුටා දිගු කලක් ජීවත්වුව ද ඔහුගේ ඒ ජීවත්වීම ඵල රහිතය. අර්ථ ශූන්‍යය.

මුලින් සඳහන් කරන ලද නුවණ, බලය හා කීර්තිය නමැති ගුණවලින් යමෙක් වඳවූයේ නම්, හිස්වූයේ නම් ඔහුගේ ජීවිතය හා කපුටාගේ ජීවිතය අතර අසමාන කමක් නැත. එබඳු අර්ථශූන්‍ය පුද්ගලයා දිගුකලක් ජීවත්වුව ද ඔහුගේ ජීවිතය බොහෝ කලක් ජීවත්වන කපුටාගේ ජීවිතය මෙනි.

♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
**පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි**
**ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය**
**ඔක්කම්පිටිය මොනරාගල**
**Sri Lanka**



**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**